අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තිය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு
Ministry of Education, Higher Education and Vocational Education

**කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව**
தொழில்நுட்பக் கல்வி மற்றும் பயிற்சித் திணைக்களம்
Department of Technical Education and Training

*Pioneer Organization in Providing Technical Education and Training in Sri Lanka*

**තැ.පෙ. 557, ඕල්කට් මාවත, කොළඹ 10.** த.பெ. 557,ஒல்கொட் மாவத்தை, கொழும்பு 10. P.O. Box 557, Olcott Mawatha, Colombo 10.

මගේ අංකය / எமது இல / My No : DTET/04/02/13/AT/2024 – 2025

ඔබේ අංකය / உமது இல / Your No :

දිනය / திகதி / Date : 2025.06.19

සියලුම තාක්ෂණ / කාර්මික විද්‍යාලවල

අධ්‍යක්ෂවරුන් /විදුහල්පතිවරුන් වෙත,

**<u>ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ නිලධාරින්ගේ වාර්ෂික ස්ථාන මාරුවීම්</u>**

**<u>සඳහා අයදුම්පත් කැඳවීම - 2026</u>**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2016.06.14 අනුමත කරන ලදුව. 2018.07.24 දින සංශෝධනය කර ඇති බවට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ අංක : PSC/EST/08-04/01/2015 හා 2018.07.26 ලිපිය මගින් දන්වා ඇති, ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ නිලධාරින්ගේ වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය මේ සමඟ එවමි.

02. ඒ අනුව, 2026 වාර්ෂික ස්ථාන මාරු මණ්ඩලය පැවැත්වීමේදී 2018.07.24 දින සංශෝධනය කරන ලද ස්ථාන මාරු පටිපාටියට අනුව කටයුතු කරන අතර, මෙම ස්ථාන මාරු වල ඉල්ලුම් පත්‍ර කැඳවීම හා තීරණ දැනුම් දීම මාර්ගගත ක්‍රමය (online) ඔස්සේ සිදු කරන බවද දන්වමි.

03. ඒ සම්බන්ධයෙන් පහත දැක්වෙන කරුණු කෙරෙහි ඔබ තාක්ෂණ/කාර්මික විද්‍යාලයේ සේවය කරන සියලුම නිලධාරින් දැනුවත් කරන ලෙස වැඩිදුරටත් දන්වා සිටිමි.

1. සියලුම වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත් මාර්ගගත ක්‍රමය හරහා දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ පල කර ඇති “DTET Annual Transfer Application” ඔස්සේ 2025.07.31 හෝ එදිනට පෙර එවිය යුතු අතර එදිනට පසුව ලැබෙන කිසිඳු අයදුම්පතක් සැලකිල්ලට භාජනය කරනු නොලැබේ.

2. ස්ථාන මාරුවීම් අපේක්ෂා කළත්, නොකළත් දැනට සිටින සේවා ස්ථානයේ නියමිත කාලය සම්පූර්ණ කරන සියලුම නිලධාරීන් ඉල්ලුම්පත් ඉදිරිපත් කළ යුතුය.

3. නිලධාරීන් විසින් වර්තමාන තනතුරෙහි සේවය කරන ලද කාර්මික / තාක්ෂණ විද්‍යාලවල තොරතුරු ඔබ විසින් මාර්ගගත ක්‍රමය ඔස්සේ එවනු ලබන ස්ථානමාරු අයදුම්පත සමඟ ඇමුණුමක් ලෙස ඉදිරිපත් කල යුතුය. (ස්ථාන මාරු අයදුම්පතෙහි 3.4 වගුව)

අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் நாயகம் / Director General: 011-3137290, 011-2431288, 011-2449136 (Fax)
කාර්යාලය / அலுவலகம் / Office: 011-2348896, 011-2348897, 011-2439078
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2439077
E-mail:- info@dtet.gov.lk
Website:- www.dtet.gov.lk
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පරිපාලන හා මුල්‍ය) / மேலதிக பணிப்பாளர் நாயகம் (நிர்வாகம்/நிதி) / A.D.G.(Administration & Finance): 011-2348895
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් ( කාර්මික අධ්‍යාපන ) / மேலதிக பணிப்பாளர் நாயகம் (தொழில்நுட்பக் கல்வி) / A.D.G ( Technical Education): 011-2437103

4. නිලධාරීන් හට පවතින විශේෂ අවශ්‍යතා හෝ පවතින අසනීප තත්වයන් පිළිබඳ වෛද්‍ය වාර්තා ඔබ විසින් මාර්ගගත ක්‍රමය ඔස්සේ එවනු ලබන ස්ථානමාරු අයදුම්පත සමඟ ඇමුණුමක් ලෙස ඉදිරිපත් කල යුතුය.

5. ඔබ විද්‍යාලයේ උපදේශකවරුන් / කථිකාචාර්යවරුන් විසින් යොමු කරන ලද අයදුම්පත් වල විස්තර නව විද්‍යුත් ලිපිනයන් ඔස්සේ Google Sheet හරහා ඔබ වෙත යොමු කරනු ලැබේ.

6. ඒ ඒ උපදේශකවරයාට අදාළ විස්තර ඉදිරියෙන් ඔබගේ නිර්දේශ ඉදිරිපත් කළ යුතුය.

04. තවද ඔබ විද්‍යාලයේ 2025.12.31 දිනට නියමිත සේවා කාලය සම්පූර්ණ කරන ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ සියළුම කථිකාචාර්යවරුන්/ උපදේශකවරුන් පිළිබඳ විස්තර, ආකෘති පත්‍ර අංක 03 අනුව 2025.07.31 දිනට පෙර අපගේ **administration@dtet.gov.lk** විද්‍යුත් ලිපිනය ඔස්සේ **පමණක් එවීමට කටයුතු කරන ලෙසද දන්වා සිටිමි.**

එස්.සී. ජගත්

අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් :-

1. ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව - කරු. දැ.ග.ස
2. ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය, (අධ්‍යාපන ,උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය) - කරු. දැ.ග.ස
3. සහකාර අධ්‍යක්ෂ, කළමනාකරණ තොරතුරු ඒකකය - අ.ක.ස

**මෙම ලිපිය ලැබී දින 03 ක් ඇතුළත ඔබ විද්‍යාලයේ සිටින අදාළ නිලධාරීන්ට මෙහි අඩංගු කරුණු දැන ගැනීම සැළැස්විය යුතුය.**